# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1970/49 - 2016 ජුනි මස 10 වැනි සිකුරාදා - 2016.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය)**

**විනිමය පාලන පනතේ 7, 10, 11, 15 සහ 30(5) වගන්ති යටතේ අවසරය**

2011 දෙසැම්බර් මස 20 දිනැති අංක 1737/9 දරන රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමෙන් අවසන් වරට සංශෝධනය කරන ලද 2002 අප්‍රේල් 19 දිනැති අංක 1232/14, 2002 අගෝස්තු 08 දිනැති අංක 1248/19, 2010 දෙසැම්බර් 21 දිනැති අංක 1685/2 දරන රජයේ *ගැසට් පත්‍රයන්ගෙන්* විනිමය පාලන පනත යටතේ පළ කරන ලද දැන්වීම්හි 2 වැනි ඡේදය තවදුරටත් පහත ආකාරයෙන් සංශෝධනය කරනු ලැබේ.

i. අයිතම (i) එනම් ''සංශෝධනය කරන ලද 1981 අංක 36 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 19(A) වගන්තියට අනුකූලව ආන්තික සැපයුම් කරුවකු ලෙස ලියාපදිංචි වූ සමාගමක් විසින් ආයෝජකයින් හට ලැයිස්තු ගත සමාගමක සුරැකුම්පත් මිලදී ගැනීම සඳහා ණය ලබාදීමේ ව්‍යාපාරය හැර අනිකුත් මුදල් ණය දීම්'' මෙමගින් ඉවත් කරනු ලැබේ.

ii. අයිතම (V) එනම් ''ආරක්ෂක කළමනාකරණය, තක්සේරුකරණය සහ තනි පුද්ගලයන්ට හෝ පෞද්ගලික ආයතනයන්ට උපදේශන සැපයීම ඇතුළු ආරක්ෂක සේවා සැපයීම'' මෙමගින් ඉවත් කරනු ලැබේ.

iii. අයිතම (ii) යටතේ දැක්වෙන ''උකසට බඩු ගැනීම'' අයිතම (i) ලෙස නැවත අංකනය කෙරේ.

iv. අයිතම (iii) යටතේ දැක්වෙන ''ඇමෙරිකන් ඩොලර් දස ලක්ෂයකට අඩු ප්‍රාග්ධනයක් ඇතිව සිල්ලර වෙළෙඳාම'' අයිතම (ii) ලෙස නැවත අංකනය කෙරේ.

v. අයිතම (iv) යටතේ දැක්වෙන ''වෙරළබඩ ධීවර කටයුතු'' අයිතම (iii) ලෙස නැවත අංකනය කෙරේ.

ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු,<br>විනිමය පාලක.

2016 ජුනි මස 10 වැනි දින,<br>කොළඹ,<br>ශ්‍රී ලංකා මහ බැංකුවේ දී ය.

06 - 928

1A - G 23641 — 27 (2016/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*